**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

-----------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---------------------

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහාවූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.9 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධානවලට අනුකූලව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය. විධිවිධානවලට අනුකූලව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ සාරාංශගත කර පහත සඳහන් සටහනේ දක්වා ඇත.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරියාගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පාරිශ්‍රමයක් දක්වා තිබීම | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.5 |
| | | 2. ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන් | 2.1(අ) |
| | | 3. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.1(ආ) |
| | | 4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2 |
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපුරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | අනුකූල නොවීම | 2.8 |
| 128(1) (ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිට ණය ශේෂ අයකර ගැනීම | 2.6 |

| | | | |
|---|---|---|---|
| | විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | | |
| 128(1) (ජ) | නිලධාරින්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | පාඩු හා හානි | 2.3 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**-----------------------------------------------**

**2.1 කාර්යසාධනය**

**----------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් මාර්ග සංවර්ධන කටයුත්තක් වන මුදුකටුව සොයිසාරාම මාර්ගය ඉදිකිරීම සඳහා රු. 7,305,000 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කළ රු.මිලියන 16 ක, ලුනාව ග්‍රොයිනය හා දෙවට මීටර් 180 ක ජියෝ බැග් රිවට්මන්ට් බැම්ම ඉදිකිරීමේ වැඩ බිම ධීවර ජනතාවගේ විරෝධය නිසා අතහැර දමා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරියට ගෙනැවිත් නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පමණක් අනවසර ඉදිකිරීම් 900 ක් හඳුනාගෙන තිබූ අතර ඉන් 793 ක් කඩා ඉවත් කිරීමට නියෝග කර තිබුණ ද කඩා ඉවත් කර තිබුණේ 123 ක් පමණි. එනම් නියෝග කළ ප්‍රමාණයෙන් සියයට 15 ක් පමණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

---

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව එකඟවී ඇති නියම, කොන්දේසිවලට අනුව වැඩ ඉටු කර ඇති බව හා සහතික කර ඇති ගෙවීම්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූල බව තහවුරු කරමින් ඉංජිනේරුවරයා විසින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු වුවත් වැලිගම වෙරළ උද්‍යානය ඉදිකිරීම, කල්පිටිය වෙරළ පාරිසරික මධ්‍යස්ථානය ඉදිකිරීම, මුතු පංතිය ග්‍රොයිනය ඉදිකිරීම සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 .(අ) හා 5.4.9 මාර්ගෝපදේශය ප්‍රකාරව රු. මිලියන 2 ට වැඩි වටිනාකමින් යුතු වැඩ සඳහා කාර්යසාධන සුරක්ෂිතයක් තබාගත යුතු වුවත් දියකඩන ඉදිකිරීම්වලදී යන්ත්‍රෝපකරණ හා වාහන සැපයුම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් එවැනි සුරක්ෂිත මුදලක් ලබාගෙන නොතිබුණි.

(ඇ) (i) දෙපාර්තමේන්තුව විසින් දියකඩන ඉදිකිරීමේදී බරවාහන හා යන්ත්‍රෝපකරණ සැපයීම වෙනුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) මාර්ගෝපදේශය පරිදි කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණු අතර වැලිගම වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීමේ 1 අදියරේදී 2015 ඔක්තෝබර් 12 දින රු.මිලියන 13.8 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත නිදහස් කර ඇති නමුත් ඒ සඳහා ද ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය පරිදි වැඩ ආරම්භ කිරීමට ප්‍රථම දෙපාර්ශවය විසින් විධිමත් ගිවිසුමකට ඇතුළත් විය යුතු වුවත් මුතු පංතිය ග්‍රොයිනය ඉදිකිරීමේදී අමුද්‍රව්‍ය සැපයීම සඳහා ගිවිසුම්වලට එළඹීමේදී ප්‍රමාදවීම් නිරීක්ෂණය වූ අතර සැපයුම අවසන් කළ යුතු දිනය පසු වන තුරුත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. කල්පිටිය වෙරළ පාරිසරික මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීමේදී කොන්ත්‍රාත්තුව ආරම්භකර දින 14 කට පසුව ගිවිසුම් අත්සන් කර තිබුණි. මන්ඩතිව් ටී දියකඩන 3 ඉදිකිරීමේදී අමුද්‍රව්‍ය සැපයීම සඳහා තෝරාගත් සැපයුම්කරුවන් සමඟ මාස 1 ත් 1 ½ ත් අතර කාලයකින් ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද වී තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව මූලික පිරිවැය ඇස්තමේන්තුව ආයතන ප්‍රධානියා විසින් අනුමත කළ යුතු වුවත් මුතු පංතිය ග්‍රොයිනය ඉදිකිරීම හා මන්ඩතිව් ටී දියකඩනය ඉදිකිරීම සම්බන්ධයෙන් ඒ අයුරින් කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව අනුව යම් කොන්ත්‍රාත්තුවක කාලය දීර්ඝ කිරීමේදී ප්‍රසම්පාදන අඛණ්ඩතාවය සැඟීමකට පත්වන පරිදි තහවුරු කරනු ලබන විශේෂ අවස්ථානුගත හේතූන්වලදී හෝ ස්වාභාවික ව්‍යසනයක දී ඒ පිළිබඳව සලකා බැලිය හැකි වේ. කෙසේ නමුත් අවස්ථා කීපයකදීම එවන් වූ හේතුවක් නොමැතිව හා දෙපාර්තමේන්තුව විසින් අදාළ කොන්ත්‍රාත්කරුගේ බිල්පත්වලට නියමිත පරිදි මුදල් නොගෙවීම හේතුවෙන් මුතුපංතිය ග්‍රොයිනය ඉදිකිරීමේදී දෙපාර්තමේන්තුව විසින්ම කාලය දීර්ඝ කර දී තිබුණි.

(ඊ) මුතු පංතිය ග්‍රොයිනය ඉදිකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව අනුව සලකා බලනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාව සඳහා අරමුදල් ලැබෙන බවට සහතිකවීමේ ක්‍රමවේදයක් නොතිබීම නිසා බිල්පත් සඳහා ගෙවීමට මුදල් නොමැති වී තිබුණි. ඒ හේතුවෙන් විශේෂ හේතූන් නොමැති අවස්ථා හතරක දී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම නිසා ව්‍යාපෘතිය මාස 4 කින් ප්‍රමාද වී තිබුණි.

(උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට 2007 ඔක්තෝබර් 03 දින එකතු වූ අතිරේකයෙහි ඡේද අංක 8.13.4 අනුව විචලතාවය සියයට 10 කට වඩා වැඩි වන්නේ නම් අදාළ ආකෘතියෙහි සඳහන් හේතු පැහැදිලි කිරීම් සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට ඉදිරිපත් කිරීමෙන් විචලතාවයන් සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත් කල්පිටිය වෙරළ පාරිසරික මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම,ගොඩවාය නිවාඩු නිකේතනය ඉදිකිරීම,වැලිගම වෙරළ උද්‍යානයේ අදියර 2 හා 3 සංවර්ධනය කිරීම යනාදී කාර්යයන්හීදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.3 පාඩු හා හානි

---------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1983 සැප්තැම්බර් 02 දිනැති අංක 260/22 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පනවන ලද වර්ෂ 1982 අංක 1 දරන වෙරළ සංරක්ෂණ නියෝග සහ අංක 2012/51 දරන 2017 මාර්තු 31 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කරන ලද වෙරළ සංරක්ෂණ නියෝග අනුව ගාස්තු අය කිරීම සඳහා බලපත්‍ර නිකුත් නොකිරීම මත රජයට ලැබිය යුතු රු.6,831,000 ක මුදලක් අහිමි වී තිබුණි.

(ආ) කොලින්ජාඩිය මීටර් 80 දියකඩනය ඉදිකිරීම , මුතු පංතිය ග්‍රොයිනය ඉදිකිරීම හා මාරවිල දියකඩනය ඉදිකිරීම යන කොන්ත්‍රාත්වලදී තෝරාගත් සැපයුම්කරුවන් විසින් යන්ත්‍ර හා ද්‍රව්‍ය සැපයුම අතර මහ නතර කිරීම හේතුවෙන් දෙවන මිල ඉදිරිපත් කර සැපයුම්කරු සේවා සැපයීම සඳහා තෝරාගැනීමට සිදුවීම නිසා රු.2,599,924 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) (i) දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ වැඩ සම්බන්ධ කොන්ත්‍රාත්, ගිවිසුම් ගත පරිදි ඉටු නොකිරීම මත අය කළ යුතු ප්‍රමාද ගාස්තුව රු.1,855,192 ක් අය කර ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් ටොන් 2 එක්ස්කැවේටර් 2 ක් නියමිත පරිදි සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් අයකළ යුතු ප්‍රමාද ගාස්තුව වූ රු. 3,808,200 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මන්ඩතිව්හී ටී දියකඩන 03 ඉදිකිරීමේදී නියමිත පරිදි කළු ගල් සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් යන්ත්‍ර හා වාහනවල අක්‍රීය කාලය වෙනුවෙන් ගෙවූ රු.469,797 ක මුදල දෙපාර්තමේන්තුවට සිදුවූ අලාභයක් බව නිරීක්ෂණය කෙරේ.

## 2.4 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ දුර්වලතාවයන් පහත දැක්වේ.

(අ) විධිමත් පරිදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා 2017 වර්ෂය තුළ ඉටුකරන ලද ව්‍යාපෘති 8 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද මූලික ඇස්තමේන්තු ඉක්මවා රු. මිලියන 28.1 ක් වැය කර තිබුණි. එසේම 2017 වර්ෂයේදී ඉටු කළ ව්‍යාපෘති 10 ක් සඳහා වර්ෂයේ වෙන්කළ ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 54.79 ක් වැය කර තිබුණි.

(ආ) 2015 ජූලි 01 දින සිට වෙරළ සංරක්ෂණ නියාමකවරයකු පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා ජනාධිපති සම්බන්ධීකාරකයකු ලෙස ජනාධිපති ලේකම් කාර්යාලයට මුදා හැර තිබූ අතර 2017 දෙසැම්බර් 31 දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් ඉටුනොකර රු. 738,893 ක් දෙපාර්තමේන්තුව විසින් ඔහුගේ වැටුප් ලෙස ගෙවා තිබුණි

## 2.5 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| 2016 | පුනරාවර්තන | 219.14 | 207.61 | 11.51 | 5.2 |
| | මූලධන | 1,827.5 | 1,122.57 | 704.99 | 38.5 |
| | **එකතුව** | **2,046.64** | **1,330.11** | **716.52** | **35** |
| 2017 | පුනරාවර්තන | 218.46 | 213.42 | 5.03 | 2.3 |
| | මූලධන | 1,116.2 | 981.66 | 134.54 | 12 |
| | **එකතුව** | **1,334.66** | **1,195.08** | **139.58** | **10.4** |

ඉහත දත්තයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක එකතුව රු.1,562,900 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් උපයෝජනය කර තිබුණේ රු.215,139 ක් පමණක් වීම හේතුවෙන් ඉතිරිය රු. 1,347,761 ක් විය. එම ඉතිරිකිරීම් වෙන්කල ප්‍රතිපාදනවලින් සියයට 42 සිට සියයට 96 දක්වා වූ පරාසයක විය.

(ආ) මූලධන වැය විෂයන් 05ක එකතුව වූ රු.මිලියන 339.50 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 218.54 ක් පමණක් වීම හේතුවෙන් ඉතිරිය රු. මිලියන 120.96 ක් විය. වැය විෂයයන් අනුව එම ඉතිරිකිරීම් සියයට 24 සිට සියයට 44 ක දක්වා වූ පරාසයක පැවතුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 757 ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 54.011 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

**2.6** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11,.00 | 10.91 | 9.00 | 10.64 | 39.00 | 33.25 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.510,614ක්වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 03 සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත් එම හිඟහිටි ණයශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) වසර 3 ත් 20 ත් අතර කාලසීමාවක් පැවති සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් සිව්දෙනෙකුගේ ණය ශේෂ එකතුව රු.363,705ක් වූ අතර මෙම ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව නියමිත පරිදි අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.7** **පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 35.79 ක් විය. පොදු තැන්පත් ගිණුමේ කාල විශ්ලේෂණය අනුව රු.මිලියන 3.93 ක වර්ෂ 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

**2.8** **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත හා 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ(සංශෝධන)පනත | |

(i) 31(ඊ) වගන්තිය

වෙරළ ආරක්ෂණ ත්‍යාග අරමුදලේ 2017 වර්ෂය සඳහා වූ ගිණුම් වාර්තා සමඟ ගිණුම් පිළියෙල කිරීමට පදනම් කර ගනු ලැබූ ප්‍රතිපත්ති ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 31(3) වගන්තිය

අධ්‍යක්ෂ ජනරාල් විසින් කඩා ඉවත් කර ගැනීමේ නියෝගය නිකුත් කරනු ලැබූ පසු ඒ පිළිබඳ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් එම නියෝගය නිකුත් කල දැන්වීම අලවනු ලැබූ දින සිට දින තුනක් ඇතුළත ඊට විරුද්ධව, අදාල අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි විය. එහෙත් කඩා ඉවත් කිරීමේ නියෝග අලවා දින 11 සිට මාස 09 දක්වා වූ කාලයක් ගත වී ඇති අනවසර ඉදිකිරීම් 07ක් සම්බන්ධයෙන් නියමිත පරිදි පසු විපරම් කර නොතිබූ අතර එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා මාර්ගයක් ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**2.9**

(iii)31(4) වගන්තිය

බිඳ හෙලීමේ විධානයක් ලැබීමෙන් පසු හෝ අභියාචනා සලකා බැලීමෙන් පසු අනවසරයෙන් සාදන ලද ඉදි කිරීම් ඉවත් කිරීමට දරන ලද මුළු වියදම සහ අනවසරයෙන් කරන ලද ඉදිකිරීම් සඳහා භාවිතා කරනු ලැබූ සියළු ද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් දරනු ලැබූ සියළු වියදම එකී තැනැත්තාගෙන් රජයට අයවිය යුතු ණයක් ලෙස සැලකිය යුතු විය. එහෙත් 2017 වර්ෂයේ දී අනවසර ඉදිකිරීම් 71ක් කඩා ඉවත් කිරීම වෙනුවෙන් දරනු ලැබූ රු. 423,200 ක වියදම අදාළ පාර්ශවයන්ගෙන් අය කර ගෙන නොතිබුණි.

**මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට වූ අනුමත, සත්‍ය හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 31 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 4 | 0 | 4 |
| (iii) | ද්විතියික මට්ටම | 321 | 254 | 67 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 173 | 124 | 49 |
| | | 539 | 409 | 130 |